රත්තොට ප්‍රාදේශීය සභාව
<u>මාතලේ දිස්ත්‍රික්කය</u>

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 28 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට රත්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගතව හෝ ඉටු නොකළ කර්මාන්ත 2 ක වටිනාකම වූ රු.1,200,000 ක් ණයහිමි කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම් හා ණයහිමියෝ සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) කර්මාන්ත 2 ක වියදම නිවැරදිව ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය සහ ණයහිමියෝ රු.28,774 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) භෞතික පැවැත්මක් නොමැති රු. 634,455 ක් වූ ගොඩනැගිලි 6 ක, රු.15,330 ක් වූ කරත්ත 2 ක හා රු.327,500 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ අවසන් ගෙවීම් සහ අතුරුදවුම් ද ගෙවා අවසන් කර තිබූ කර්මාන්ත 4 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ලැබියයුතු ණයගැතියන් ලෙස රු.48,791ක් දක්වා තිබීම නිසා ණයගැති ශේෂය රු.48,791 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) (i) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රතිපූර්ණය වී තිබූ රු.48,837 ක කර්මාන්ත අතුරුදවුම් මුදල් නිවැරදිව ගිණුම්ගත කර නොතිබීම නිසා සමාන වටිනාකමින් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර වැඩියෙන් හා ණයහිමියන් අඩුවෙන් දැක්වුණි.

(ii) ඉහත ප්‍රතිපූර්ණ වූ මුදල ණයගැතියන්ට නොගැළපීම හා කර්මාන්තයට අදාළව ලැබිය යුතු නොවන තවත් රු.14,255 ක් ණයගැති කර තිබීමෙන් ණයගැති ශේෂයද රු.63,092 කින් වැඩියෙන් දැක්වුණි.

(ඊ) 2017 වර්ෂයේ වෙන්දේසියෙන් ඉවත්කර තිබූ නමුත් ගිණුම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් වර්ෂයේ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.291,750 ක් සහ ලී බඩු හා සවිකිරීම් ශේෂය රු.41,385 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(උ) පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ පරිත්‍යාග ලෙස ලැබී තිබූ කසළ තලන යන්ත්‍රයක, රෝගී ඇඳක සහ 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව හඳුනාගෙන තිබූ 1 " GI බට ( කොඩි කණු) 134 ක වටිනාකම ගණනය කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකර නොතිබුණි.

(ඌ) කර්මාන්ත ලිපිගොනු අනුව 2016 වර්ෂයේදී වැඩ නිමකර තිබූ ගොඩනැගිලි 4 ක වටිනාකම වූ රු.1,862,172 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ අවසානයට ගබඩා ණයහිමි ශේෂය රු.4,840,350 ක් වැඩියෙන් දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබියයුතු මුද්දර ගාස්තු ආදායම රු.415,360 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) ශේෂ පත්‍රයේ අවසන් තොග වටිනාකම රු.69,900 ක් අඩුවෙන් දැක්වුණි.

(ඕ) 2005 ජූනි මස 27 වන දින අංක 2746 දරන ඔප්පුව යටතේ සභාවට පැවරී තිබූ රු.25,000 ක වටිනාකමින් යුතු පර්චස් 24 ක බණ්ඩාරපොල එස්.කේ. නැමති ඉඩමේ කොටස ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
----------------------
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.76,362,599 ක් වූ ගිණුම් විෂයන් 6 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම් පැවති අතර, නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.16,228,871 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම
-------------------
1997 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පවතින රු.15,462 ක් වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් නොකර දිගින් දිගටම ගිණුම්වල දක්වා තිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 11 ක එකතුව රු.30,709,749 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොවී පවතින රු.4,433,115 ක් වූ ශේෂයක් ද ඊට ඇතුළත්ව තිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ 2 ක වටිනාකම රු.30,172,305 ක් වූ අතර, ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 5 කට වැඩි කාලයක් තිස්සේ නිරවුල් නොකර පවතින එකතුව රු.1,167,714 ක් වූ ශේෂ ඊට ඇතුළත් වී තිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.178,359,446 ක් වූ ගිණුම් විෂයයන් 7 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාව | | |
| (අ) 69 රීතිය | - | ඉඩම් විකිණීම මත බදු පිළිබඳ ලේඛනයක් පී.එස්. 26 සී ආකෘතිය ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ආ) 115 රීතිය | 857,083 | ගබඩා ද්‍රව්‍ය ලැබුණු බවට හා නියමිත ඉන්වෙන්ට්‍රියෙහි හෝ තොග පොතෙහි ඇතුළත් කරන ලද බවට සහතිකයක් මගින් තහවුරු කිරීමක් නොමැතිව ආයුර්වේද ඖෂධ සහ පුස්තකාල පොත් මිලදීගෙන තිබුණි. |

(ඇ) 217 රීතිය — ඉඩම් හා ගොඩනැඟිලි පිළිබඳව ලේඛනයක් පී.එස්.46 ආකෘතිය ප්‍රකාරව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) 218 රීතිය — සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි මංමාවත්, සුසාන භූමි, ක්‍රීඩාපිටි, පොදු ළිං, නල ළිං සම්බන්ධයෙන් සභාව ආරම්භයේ සිට මේ දක්වා කිසිදු සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු 9,683,851 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,758,888 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,612,000 | 9,291,442 | 7,692,173 | 9,326,463 | 6,287,900 | 8,098,641 | 7,343,989 | 7,735,636 |
| (ii) | කුලී | 2,220,000 | 2,524,000 | 2,051,685 | 1,233,756 | 2,428,000 | 2,207,477 | 2,106,786 | 761,470 |
| (iii) | බලපත්‍ර | 900,000 | 992,460 | 992,460 | 405,686 | 850,000 | 963,600 | 963,600 | 405,686 |
| (iv) | වෙනත් ආදායම් | 1,495,000 | - | 1,803,055 | - | 1,403,300 | - | 1,836,329 | - |

#### 2.2.2 වරිපනම් හා බදු

(අ) වරිපනම්

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි වරිපනම් බදු ශේෂය රු.1,539,310 ක් වූ අතර එම ශේෂය තුළ වසර 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවූ රු.309,960 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ii) සභාවේ ලේඛනවල බිල් වී තිබූ නමුත් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් නොකළ හා තක්සේරුවට යටත් නොවූ දේපළ 19 කට අයත් නිකවැල්ල පාරේ නිවාසවලින් අයවිය යුතු ලෙස රු.365,064 ක වරිපනම් ශේෂයක් පැවතුණි.

(ආ) අක්කර බදු

------------

ප්‍රාදේශීය සභා පනතේ 134(3) ප්‍රකාරව අමාත්‍යවරයා විසින් විශේෂ ප්‍රදේශයක් ලෙස නම්කර නොතිබියදී අක්කර බදු සඳහා බිල්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි අක්කර බදු ශේෂය රු.365,331 ක් වූ අතර එම ශේෂයට වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ඉක්ම වූ රු.125,664 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ඇ) ජල ගාස්තු

-----------

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි ජල ගාස්තු ශේෂය රු.7,421,822ක් වූ අතර, එම ශේෂයට වර්ෂ 1 ත් 5 ත් අතර කාලයක් ඉක්මවූ රු.1,257,266 ක ශේෂ ඇතුළත්ව තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්බන්ධතා ලබාදී තිබූ ජල පාරිභෝගිකයින් 4529 ක ගෙන් 187 දෙනෙකු සඳහා පමණක් ජල මනු සවිකර තිබූ බැවින් ජල පාරිභෝගිකයින් 4342 දෙදෙනෙකුගෙන් විධිමත් ක්‍රමවේදයෙන් බැහැරව මාසිකව ස්ථාවර ගාස්තුවක් අයකර තිබුණි.

(iii) 2014 වර්ෂයේ සිට ජලය බෙදා හැරීමක් සිදු නොවන සව්සිරිපුර ජල යෝජනා ක්‍රමයේ ජල පාරිභෝගිකයින් 70 දෙනෙකුගෙන් රු.98,165 ක හා උඩ වේරගම ජල පාරිභෝගිකයින් 100 දෙනෙකුගෙන් රු.168,016 ක හිඟ ජල ගාස්තු අයකරගත නොහැකි තත්ත්වයක පැවතුණි.

2.2.3 බලපත්‍ර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බලපත්‍ර ගාස්තු ශේෂය රු.405,686 ක් වූ අතර, එය වර්ෂ 5 කට පෙර පැවත එන ශේෂයක් විය.

2.2.4 බදු කුලී

----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි බදු කුලී ශේෂය රු.1,233,756 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂයකට වැඩි රු.530,166 ක හිඟහිටි ශේෂයක් ඇතුළත්ව තිබුණි.

2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු.690,500 ක් හා මුද්දර ගාස්තු රු.9,011,050 ක් විය.

2.3 අධිභාර
--------
ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂ වලදී පනවන ලද අධිභාර වලට අදාළව 2017දෙසැම්බර් 31 දිනට රු.912,514 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර 2018 ජුනි 8 දින වන විට ඉන් රු.130,586 ක් අයවී තිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
------------------------
3.1 කාර්යසාධනය
----------------
ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා
----------------
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 2 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් එකී අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.
----------------------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශයේ පරිදි කුරුවාව ළමා උද්‍යානයේ වැඩ අවසන් කර ප්‍රදේශයේ වෙසෙන දූ දරුවන්ගේ විනෝදාස්වාදය සඳහා පහසුකම් සැලසීම විශේෂයෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන කාර්යයක් ලෙස දක්වා තිබුණි. එහෙත් කුරුවාව ළමා උද්‍යානයේ ළමා උද්‍යාන උපකරණ මිලදී ගැනීම සහ සංවර්ධනය සඳහා 2015 සහ 2017 වර්ෂවලදී රු.2,847,305 ක් වියදම් දරා තිබුණද, භාවිතයට ගත හැකි පරිදි ළමා උද්‍යානයේ ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්
--------------------------------------
2017 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් මඟින් ඉටු කිරීමට යෝජිතව තිබූ ප්‍රතිපාදන මුදල රු.5,550,000 ක් වූ ව්‍යාපෘති 9 ක ඉදිකිරීම් කටයුතු 2018 මාර්තු 20 දින වන විටද ආරම්භ කර හෝ නොතිබුණි.

(ඈ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
--------------------------------
(i) බල ප්‍රදේශයේ දෛනිකව එකතු වන ටොන් 2 ක පමණ අපද්‍රව්‍ය සභාවේ ට්‍රැක්ටර් 02 ක්, කම්පැක්ටරයක් හා සේවකයින් 10 දෙනෙකු යොදවා දෛනිකව පොහොර කිලෝග්‍රෑම් 15 ක් පමණ නිෂ්පාදනය කරන අතර කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා නොගන්නා නොදිරන කසළ සියයට 25 ක් පමණ ගොඩගසා තැබීමේ ක්‍රමයක් ද අනුගමනය කරමින් තිබුණි.

(ii) 2016 සහ 2017 වර්ෂවලදී රු.1,919,223 ක් වැයකර අඩක් ඉදිකර තිබූ කුරුවාව කසළ වර්ගීකරණ මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවති අතර, කසළ වර්ගීකරණ කටයුතු සිදු කිරීමට යෝජිත ආකාරය පිළිබඳ විධිමත් සැලස්මක් නොවුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක
----------------------------
තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 යටතේ සභාව මගින් නගරයේ ව්‍යාපාරික තත්ත්වය ඉහල නැංවීම සහ පිරිසිදු ජලය හා සනීපාරක්ෂාව යන තිරසාර සංවර්ධන ඉලක්ක ලඟාකර ගැනීමට අදාළ කාර්යයන් නියාමනය සඳහා වූ ක්‍රමවේදයන් හඳුනාගෙන නොතිබුණි. එමෙන්ම ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොවීම, සම්පත් අවම වීම හා තිරසාර සංවර්ධන අරමුණු පිළිබඳව ප්‍රමාණවත් දැනුමක් කාර්ය මණ්ඩලය තුළ නොවීම යන අඩුපාඩු හේතුවෙන් එකී ඉලක්ක ළඟාකර ගැනීම ගැටළු සහගත තත්ත්වයක පැවතුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා
----------------------------------
1999 වර්ෂයේ සිට 2010 දක්වා කාලයට අදාළ රු.174,687 ක අත්තිකාරම් ශේෂයක් නිරවුල් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය
----------------------------------
විශ්‍රාම ගිය, සේවය හැරගිය සහ මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.56,656 ක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා
----------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ දෙක තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 118 කින් අයදුම්පත් 97 ක් සඳහා අනුමැතිය ලබාදී තිබුණු නමුත් ඉන් අයදුම්පත් 11 ක් සඳහා පමණක් අනුකූලතා සහතික නිකුත් කර තිබුණි.

(ආ) 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන මධ්‍යම පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 5(i) වගන්තිය සභාවට අයත් කයිකාවල ප්‍රදේශයේ පිහිටි කඩ කාමර 9 සඳහා 2009 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව 2011 ජනවාරි සිට 2017 වර්ෂය දක්වාම කඩ කාමර කුලී අයකරමින් පැවතුණු අතර, ටී.ඩී. ජයරත්න මාවතේ පිහිටි කඩ කාමර 4 ක් සඳහාද කුලිය සංශෝධනය නොකර සභා තීරණයක් මත පදනම්ව 2012 පෙබරවාරි සිට රු.1,000 ක මාසික කුලියක් අයකර තිබුණි.

(ඇ) ටී.ඩී. ජයරත්න මාවතේ කඩ 22 කට අදාළව පළාත් තක්සේරුකරු විසින් 2009 වර්ෂයේදී මාසික කුලිය තක්සේරු කර තිබුණද, එකී තක්සේරුව සඳහා වූ විරෝධතා මත සංශෝධිත තක්සේරුවක් සිදුකර ගැනීමට නොහැකිව තිබුණි. ඒ අනුව 2010 අගෝස්තු මස පැවති මහා සභා තීරණ අංක 4.4.11 ප්‍රකාරව කඩ කුලී සංශෝධනය කර තක්සේරුගත කුලියට වඩා අඩු කුලියක් අය කිරීම

හේතුවෙන් 2011 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා සභාවට අහිමි වූ මුදල රු.2,013,060 ක් විය.

(ඇ) රන්ජන් විජේරත්න මාවත බිම් මහලේ කඩ කාමර 20 ක් සම්බන්ධයෙන් පළාත් තක්සේරුකරු විසින් 2009 වර්ෂයේදී මාසික කුලිය තක්සේරු කර තිබියදී ඊට වඩා අඩු කුලියක් සභාව විසින් අයකර තිබීම හා වර්ෂ 5 කට වරක් කුලිය සංශෝධනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2011 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා සභාවට අහිමි වූ මුදල රු.411,720 ක් විය.

3.5 වත්කම් කළමනාකරණය

---------------------------

3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

------------------------------------------

2017 මැයි 22 දින සිට ක්‍රියා විරහිතව තිබූ කෘ කැබ් රථයේ මයිලෝ මීටරය 2017 දෙසැම්බර් 20 දින වන විටත් නැවත සකස්කර නොතිබූ අතර වාහනය සඳහා 2017 වර්ෂය තුළ රු.84,550 ක ඉන්ධන ලබාදී තිබුණි.

3.5.2 පවරා නොගත් වත්කම්

------------------------

1998 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශය මඟින් ප්‍රාදේශීය සභාව වෙත ලබාදී තිබූ රු.1,500,000 ක් වටිනා මිට්සුබිෂි කැබ් රථය සභාවේ නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.3 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පැවති රු.1,632,150 ක් වටිනා වාහන 9 ක් අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පුර නැඟුම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී රු12,751,577 ක් වැයකර 2015 මාර්තු 16 දින ඉදිකිරීම් අවසන් කර තිබූ මහල් දෙකකින් සමන්විත සතිපොළ ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවතුණි.

3.5.4 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

-------------------------------------------

අංකෙළිමැඩිල්ල මාළුස්සාගොල්ල සුසාන භූමියේ අයිතිය තහවුරු කර නොගැනීම හේතුවෙන් පෞද්ගලික පදිංචිකරුවෙකු ඉඩමේ කොටසක් අල්ලාගෙන තිබූ අතර, ඒ සම්බන්ධයෙන් වූ නඩුව වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රු.89,000 ක් වැයකර තිබුණි.

3.6 ප්‍රසම්පාදනය

-------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සිවිල් වැඩ, භාණ්ඩ හා වෙනත් සේවා ඇතුළත් සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල

සටහනක්ද පිළියෙල කර නොතිබූ අතර 2017 ජනවාරි සිට නොවැම්බර් දක්වා රු.3,898,678 ක මිලදී ගැනීම් සිදුකර තිබුණි.

3.6.2 සැපයීම් හා සේවා

------------------

සමාලෝචිත වර්ෂය තුළ සිදුකර තිබූ මිලදී ගැනීම් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) නියැදි පරීක්ෂාවට ලක්වූ පිළිවෙලින් රු.217,304 හා රු. 822,895 ක්වූ මිලදීගැනීම් අදාළ මිල ගණන් සම්බන්ධයෙන් 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(7)(1) හා 178 (7) (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3(ඇ) සහ 5.6 වගන්ති ප්‍රකාරව ඉතා කෙටි සහ පැහැදිලි පිරිවිතරයන් සකස් නොකර, අවශ්‍ය කාර්යාලීය උපකරණවල නම් පමණක් සඳහන් කර, සැපයුම්කරුවන් 11 ක් ලියාපදිංචි වී තිබියදී ආයතන 3 කින් පමණක් මිල කැඳවීම් සිදුකර විනිවිදභාවයකින් තොරව පෞද්ගලික ආයතනයකින් රු.647,590 කට කාර්යාල උපකරණ මිලදීගෙන තිබුණි.

3.6.3 කොන්ත්‍රාත් පරිපාලනය

--------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රත්තොට මහජන පුස්තකාලය වෙන් කිරීම

------------------------------------------------

සභා අරමුදලින් රු.303,270 ක් වැයකර තිබූ යථෝක්ත ව්‍යාපෘතිය සඳහා රු.204,876 ක් වැයකර ද්‍රව්‍ය මිලදී ගැනීම සභාවෙන් සිදුකර මිල කැඳවීමෙන් තෝරාගත් පෞද්ගලික ආයතනයන් මඟින් කර්මාන්තය ඉටුකරවාගෙන තිබූ නමුත්, කර්මාන්තය සඳහා විධිමත් ඇස්තමේන්තුවක් සකස්කර නොතිබුණු අතර, තෝරාගත් පෞද්ගලික ආයතනය සමඟ විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) සභාවේ අභ්‍යන්තර දූරකථන පද්ධතිය නවීකරණය කිරීම.

------------------------------------------------------------

සභාවේ පැවැති අභ්‍යන්තර දූරකථන පද්ධතිය නවීකරණය කිරීම සඳහා 2017 මැයි 12 වන දින ආයතන 4 කින් මිල ගණන් කැඳවා ලැබී තිබූ මිල ගණන් අනුව පෞද්ගලික ආයතනයකින් එම කාර්යය ඉටුකරවාගෙන රු.152,750 ක් ගෙවීම්කර තිබූ නමුත් අවශ්‍ය දූරකථන ප්‍රමාණය හා අනෙකුත් විස්තර පැහැදිලි ලෙස මිල කැඳවීමේ ලිපිවල සටහන් නොකර මිල කැඳවීම් සිදු කිරීම නිසා විධිමත් පරිදි මිල ගණන් සැසඳීම් සිදුකළ නොහැකි වී තිබුණු අතර, තෝරාගත් පෞද්ගලික ආයතනය සමඟ ගිවිසුමකට ද එළඹ නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ආදායම් විෂයන් 7 කට අදාළ රු.10,230,000 ක ඇස්තමේන්තුගත ආදායම් කිසිවක් අයකරගෙන නොතිබුණු අතර, ආදායම් විෂයන් 27 ක ඇස්තමේන්තුගත ආදායම හා තථ්‍ය ආදායම අතර විචලනය සියයට 46 සිට සියයට 8697 අතර පරාසයක පැවැතුණි.

(ආ) වැය විෂයන් 15 ක් සඳහා සලසා දී තිබුණු රු.504,000 ක ප්‍රතිපාදන වලින් කිසිදු වියදමක් නොදරා ඉතිරි කර තිබූ අතර, වැය විෂයන් 21 කට අදාළව ශුද්ධ ප්‍රතිපාදනය සහ තථ්‍ය වියදම අතර, සියයට 40 සිට සියයට 98 අතර පරාසයක විචලනයක් පැවතුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
---------------------------------------------------------
2014 අගෝස්තු 08 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක සීපීසී/සීඑල්ජී/1/9/1/4 දරන ලිපිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා තිබුණද ආයතනයේ දුර්වලතා මගහරවා ගැනීම සඳහා එලදායී අයුරින් එම කමිටු තීරණ උපයෝගී කරගෙන නොමැති අවස්ථා පැවතුණි.

5. පද්ධති හා පාලනය
-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ----------- | | ---------------------- |
| (අ) | ණයගැති / ණයහිමි | (i) | ණයගැතියන් හා ණයහිමියන් වැඩිපුර ගිණුම්ගත කිරීම. ණය හිමියන් නිරවුල් නොකිරීම. |
| | | (ii) | ණයගැතියන්ගෙන් මුදල් අයකර නොගැනීම. |
| | | (iii) | |
| (ආ) | වත්කම් / දේපළ | (i) | ස්ථාවර වත්කම් ලේඛන නොපැවැත්වීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් සමීක්ෂණය නොකිරීම. |
| | | (iii) | වත්කම් නිවැරදිව ගිණුම්ගත නොකිරීම. |
| | | (iv) | වෙන්දේසියෙන් ඉවත් කළ වත්කම් ගිණුම්වලින් ඉවත් නොකිරීම. |
| | | (v) | වත්කම් ඌන උපයෝජිතව හා නිෂ්ක්‍රීයව පැවතීම. |
| (ඇ) | තොග | (i) | ලේඛනවල ඇතුළත් නොවූ ගබඩා ද්‍රව්‍ය පැවතීම. |
| | | (ii) | වෙන්දේසියෙන් ඉවත් කළ ගබඩා ද්‍රව්‍ය ලේඛනවලින් ඉවත් නොකිරීම. |